පී. ඒ. ලෙස්ලි ගාමිණී
රේගු මාධ්‍ය ප්‍රකාශක / රේගු අධ්‍යක්ෂ
රේගු මාධ්‍ය ප්‍රකාශක



# රේගුවයි ඔබයි 2

## ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කර හා සීමා කර ඇති භාණ්ඩ කිහිපයක්

අබිං, ගංජා, හෂීස්, කොකේන්, හෙරොයින්, ඇල්, ඇස්. ඩී. ආදි විෂ මත් ද්‍රව්‍ය, නරක් වූ හෝ කල් ඉකුත් වූ ආහාර වර්ග,

කඩු, කිනිසි, කලා කිරිඇද්ඇද, කැති, දිග තල සහිත පිහියා වැනි භයානක අවි ආයුධ,

තුවක්කු, රයිපල්, සුළං තුවක්කු, පිස්තෝල, රිවෝල්වර, පතරොම්, උණ්ඩ සහ මූනිස්සම් මාරක තුවක්කු ලෙස පරිවර්තනය කළ හැකි ව්‍යාජ තුවක්කු,

අසභ්‍ය ප්‍රකාශන, පොත් පත්, පත්‍රිකා, අපහාසාත්මක ප්‍රකාශන හා වීඩියෝ පට,

අමු පැලෑටි, පළතුරු, සජීවී සතුන්, උරගයන් සහ කුරුල්ලන්,

බුද්ධිමය දේපලට එරෙහි භාණ්ඩ,

ප්‍රමිතියෙන් තොර භාණ්ඩ,

## භාණ්ඩ ආනයනයේ දී ලබා ගත යුතු බලපත්‍ර

ප්‍රමිතියට ගැණෙන භාණ්ඩ

(ප්‍රමිති කාර්යාංශයෙන් ලබා ගත යුතු බලපත්‍රය)

ආහාර වර්ග

(ආහාර හා ඖෂධ පරික්ෂකගේ අනුමැතිය)

සුවඳ විලවුන් ඖෂධ හා උපකරණ

(සුවද විලවුන්, ඖෂධ හා උපකරණ පිළිබද අධිකාරියේ බලපත්‍රය)

විකිරණශීලි ද්‍රව්‍ය

(පරමාණුක බලශක්ති අධිකාරියේ අවසර පත්‍රය)

ගිනි අවි

(ආරක්ෂක අමාත්‍යාංශයේ බලපත්‍රය)

විදුලි සංදේශ උපකරණ

(විදුලි සංදේශ කොමිසන් සභාවේ බලපත්‍රය)

පරිසරයට හානි කර ද්‍රව්‍ය

(පරිසර අධිකාරියේ බලපත්‍රය) ශාඛ හෝ පැලෑටි

(ශාඛ හෝ පැලෑටි නිරෝධායන සහතිකය)

සත්වයන් හෝ සත්ව කොටස්

(සත්ව නිරෝධායන සහතිකය)

## මගීන්ගේ ගමන් බඩු සදහා ලැබෙන තීරු බදු නිදහස් දීමනාව

විදේශීය රටක සිට ශ්‍රී ලංකාවට යන ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් හිමි මගීන් සදහා තමන් විසින් රැගෙන යන පෞද්ගලික ගමන් බඩු සදහා නිදහස් තීරු බදු ප්‍රමාණයක් හිමිවේ.

(1) මගියා විදේශයේ ගත කරන ලද කාලය දින 90 ක කාලයකට වඩා අඩු නම් ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 125 කට සමාන වටිනාකමින් යුතු භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව රැගෙන යා හැකිය. ඔහු හෝ ඇය ශ්‍රී ලංකාවේ කටුනායක ගුවන් තොටුපලේ පිහිටි තීරු බදු නිදහස් සාප්පු සංකීර්ණයෙන් යම්කිසි භාණ්ඩයක් මිල දී ගන්නේ නම්, ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 187.50 කට සමාන ප්‍රමාණයක් වටිනා භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව ලබා ගැනීමට හැකිවේ.

(2) මගියා විදේශයේ ගත කරන ලද කාලය දින 90 ක කාලයකට වඩා වැඩි, එහෙත් දින 365 කට වඩා අඩු නම්, ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 500 කට සමාන වටිනාකමින් යුතු භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව රැගෙන යා හැකිය. ඔහු හෝ ඇය ශ්‍රී ලංකාවේ කටුනායක ගුවන් තොටුපලේ පිහිටි තීරු බදු නිදහස් සාප්පු සංකීර්ණයෙන් යම්කිසි භාණ්ඩයක් මිල දී ගන්නේ නම් ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 625 කට සමාන ප්‍රමාණයක් වටිනා භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව ලබා ගැනීමට හැකිවේ.

(3) මගියා විදේශයේ ගත කරන ලද කාලය දින 365 ක කාලයකට වඩා වැඩි නම් ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 1000 කට සමාන වටිනාකමින් යුතු භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව රැගෙන යා හැකිය. ඔහු හෝ ඇය ශ්‍රී ලංකාවේ කටුනායක ගුවන් තොටුපලේ පිහටි තීරු බදු නිදහස් සාප්පු සංකීර්ණයෙන් යම් කිසි භාණ්ඩයක් මිල දී ගන්නේ නම්, ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 1750 කට සමාන ප්‍රමාණයක් වටිනා භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව ලබා ගැනීමට හැකිවේ.

(4) ශ්‍රී ලංකාවට තනියම යන බාල වයස්කරුවකු විදේශයේ ගත කරන ලද කාලය දින 90 ක කාලයකට වඩා අඩු නම් ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 87.50 කට සමාන වටිනාකමින් යුතු භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව රැගෙන යා හැකිය. ඔහු හෝ ඇය ශ්‍රී ලංකාවේ කටුනායක ගුවන් තොටුපලේ පිහිටි තීරු බදු නිදහස් සාප්පු සංකීර්ණයෙන් යම්කිසි භාණ්ඩයක් මිල දී ගන්නේ නම්, ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 125 කට සමාන ප්‍රමාණයක් වටිනා භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව ලබා ගැනීමට හැකිවේ.

(5) ශ්‍රී ලංකාවට තනියම යන බාල වයස්කරුවකු විදේශයේ ගත කරන ලද කාලය දින 90 ක කාලයකට වඩා වැඩි නම් ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 187.50 කට සමාන වටිනාකමින් යුතු භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව රැගෙන යා හැකිය. ඔහු හෝ ඇය ශ්‍රී ලංකාවේ කටුනායක ගුවන් තොටුපලේ පිහිටි, තීරු බදු නිදහස් සාප්පු සංකීර්ණයෙන් යම්කිසි භාණ්ඩයක් මිල දී ගන්නේ නම්, ඔහුට හෝ ඇයට ඇමරිකන් ඩොලර් 187.50 කට සමාන ප්‍රමාණයක් වටිනා භාණ්ඩ තීරු බද්දෙන් නිදහස්ව ලබා ගැනීමට හැකිවේ. මෙම තීරු බද්දෙන් නිදහස් දීමනාව හිමි වන්නේ තමා විසින් රැගෙන එන පෞද්ගලික ඇදුම් පැළඳුම් හා තමා පාවිච්චි කරන නිර්ව්‍යාජ බඩු භාණ්ඩ සදහා පමණි.

ඊට අමතරව ඕනෑම වැඩිහිටි ශ්‍රී ලාංකික හෝ විදේශීය මගියකුට මත්පැන් ලීටර් 2.5 ක් ද, වයින් ලීටර් 2 ක් ද, සුවද විලවුන් ලී 0.25 ක් ද, තීරු බද්දෙන් නිදහස්ව ලබා ගත හැකිවේ.

යම් පුද්ගලයෙක් වාණිජමය ස්වරූපයෙන් යම් භාණ්ඩ තොගයක් ගෙන එන්නේ නම් ඒවාට තීරු බදු හා අනෙකුත් බදු අය කරන අතර, ඊට අමතරව දඩ මුදලක් ද ගෙවීමට සිදුවේ.

එසේම ශ්‍රී ලංකාවට ගෙන යාමට සම්පූර්ණයෙන් තහනම් හෙරොයින් වැනි විෂ මත් ද්‍රව්‍ය වැනි දේ හෝ වලංගු බලපත්‍රයකින් පමණක් ගෙන යා හැකි සත්ව හා ශාඛ කොටස් වැනි භාණ්ඩ ගෙන යාම දැඩි දඩුවම් ලැබීමට හේතුවේ.

සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න / Advertising Enquiries
S Jayasinghe 03 8707 4604 / 0402 025 516

